# සංක්‍රමණිකයකුගේ සටහන

**නොවැම්බර් 13**

මැකී ගිය තරු ලකුණ
සටන් සගයන් අතැර
සොයා යනු කෙලසක ද
කියාපන් මට සබඳ

සොයා ගොස් නිසි මගම
විමුක්තිය මව් බිමට
වැඩ කරන දුක් විඳින
සහෝදර ජනයනට
පුදා රුහිරය සවිය
නිමා කළ නුඹ දිවිය
සදා සමරණු පිණිස
මලක් විය පර නොවන

දහස් ජනතා සිතේ
පිපී සුදිලෙනු ඇතේ

විඳ ගනිමි නුඹ සුවඳ
සදා සෙනෙහෙන් සබඳ
සොයා නුඹ පැතු ලොවම
බලා ඉන්නෙමි නිබඳ

තරු ලකුණ මැකුණ පසු
හිස් තැනකි පිරෙනු නැති

**විකසිත කලා කවය -** විකසිත කලා කවය මගින් සංවිධානය කර තිබුන ආප්ප කොත්තු රාත්‍රියට සහභාගි වෙලා හිටපු වේලේ බොහොම දේවල් හිතුනත් කෙටියෙන් මේ ටිකනම් ලිවිය යුතුමයි කියලා හිතුනා. යහපත් අරමුණකින් මිනිස්සු වැඩ කරන්න ගත්තම කරන වැඩේ දියුණුව වළක්වන්න බැහැ. හේතුව යහපත් අරමුණක් සඳහා කැපවෙන්න පුළුවන් වෙන්නේ යහපත් පවිත්‍ර මිනිසුන්ට පමණක් නිසා. මේ වෙලාවෙත් සමාජය තුල විවිධ අරමුණු වෙනුවෙන් බොහෝ සංවිධාන බිහිවෙමින් බොහෝ කටයුතු අරඹනවා. ඒත් බොහෝ සංවිධානවල වැඩ කටයුතු සීමා වන්නේ කෙටි කාලයකට. නොකඩවා ඉදිරියට යන්නේ සීමිත කොටසක් පමණකි. විකසිත කලා කවය අන්න ඒ කොටසේ ඉදිරියෙන්ම ඉන්නවා. අපි විකසිත අගය කරන්නේ ඒ නිසයි. ඒ අපි ඔවුන්ගෙ අරමුණත්, කැපවීමත්, එහි ප්‍රතිඵලත් දකින නිසයි. නව ලෝකය දකින්නට උත්සාහ දරන, කොම්පියුටරය සිහිනයක්ම පමණක් වී ඇති දුප්පත් දරුවන්ට නොමිලයේ කොම්පියුටර් පුහුණුව ලබා දීම උදෙසා පුරෝගාමීව කටයුතු කිරීමට බරපැන සොයා ගැනීම සඳහා ඔවුන් කරන මේ කාර්යය ප්‍රශංසනීයයි. ලංකාවේ දරුවන්ට කොම්පියුටර් පුහුණුව සඳහා දැන් සෑම ගමකම පාහේ පාසැල් තිබුණත් ඒ සියල්ල සඳහා මුදල් මුල් වී ඇති බව සියලු දෙනාම දන්නා කාරණයක්. සියල්ල මුදලට කිරීමට හුරු වී ඇති සමාජයක, දරුවනට අවශ්‍ය පුහුණුව නොමිලයේම ලබා දීමට අවශ්‍ය පුහුණු ගුරුවරුන් ඒ කටයුතු සාර්ථකව මෙහෙයවීම සඳහා නොමිලයේම දායක වන අවංක දේශපාලන සංවිධානයක සහයත් විකසිතට ලැබීම සතුටට කාරණයක්. ඔවුන්ගේ ඒ තේරීම කොතරම් නිවැරදිද යන්න වැටහෙන්නේ පොදු කටයුතු සඳහා එකතු කරන ලද ඩොලර් දහස් ගණනක් බාර දීම සඳහා අවංක සංවිධානයක් තෝරා ගැනීමට නොහැකිව ලතවන සංවිධාන දුටු විටයි. කෙසේ නමුත් මේ වැඩ පිළිවෙල සාර්ථකව ඉදිරියට කරගෙන යාමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි විකසිත කලා කවයේ ක්‍රියාකාරීන්ට සුභ පතනවා.

**මුතුහෙට්ටි -** දකුණේ ඡන්දේ ඉවර වෙලත් ඒ ගැන යලිත් ලියන්න හිතුනේ "මුතු" නිසාමයි. ඡන්දෙට ආපු අනර්කලීලා, සචින් වාසලා ජාම බේර ගත්ත හැටි, ජ.වි.පෙ. තනියම නැගිටපු හැටි, මුතූගේ වලිය දැන් ඉතිහාසයට එක්වෙලා ඉවරයි. ඒත් ඡන්දෙදි ඇතිවුන සියලු කලබගෑනි අතරේ මුතුහෙට්ටිගේ විරෝධය ගැන අපි කථා කළ යුතුමයි. මුලින් වීරයෙක් ලෙස ආරම්භ කරලා අවසානයේ විකාරයක් බවට පත්වෙලා කෙළවර උනත්, ඒක පුද්ගල විරෝධය අපට (ලංකාවේ සමාජයට) හොඳ ආදර්ශයක් ලබා දුන්නා කියලා මටනම් හිතෙන්නේ. අගමැති, ඇමති මණ්ඩලේ ඉඳලා ආණ්ඩුවේ පහළම නියෝජිතයා දක්වාම යුද්ධයට මුවාවී ගෙන කරන ඕනෑම පජාතී හොර තක්කඩි කර බාගෙන අනුමත කර ගෙන නිහඬව සිටීම වැදගත් ශීලාචාරකමක් ලෙස සළකන මොහොතක එය එසේ නොවී ඒ ඒකාධිපතිත්වයට විරුද්ධව සටනක් දිය යුතුය යන්න ඔහු ප්‍රායෝගිකව ඔප්පු කරලා පෙන්නුවා. ඒ සඳහා ඔහුගේ විරෝධය ජනාධිපති දක්වාම විහිදුනා. එයයි වැදගත්. අවසානයේ සියලුම හුදකලා සටන් පරාජය වීම අනිවාර්යය බව ඔප්පු කරමින් ඔහු පැත්තකට විසි උනත් ඔහු මතුකල විරෝධය, එල්ල කල අභියෝගය සුළු කොට තකන්න බැහැ.

**සරණාගත බෝට්ටු -** මේ සරණාගත ප්‍රශ්නය ගැන අපි කථා කලත් කථා කරන්නේ දුකෙන්. අපට ඒ මිනිස්සු ගැන දුකයි, අපේ රට ගැන දුකයි, සේරටම වඩා අපේ රටේ විදේශ අමාත්‍යාංශෙ උන් ගැන දුකයි. කොටි හෝ දෙමළ හෝ මේ සේරම වැටෙන්නේ "ශ්‍රී ලංකන්" ගණයට. ඒ නිසා වගකිව යුතු රජයක් ලෙස මේ ප්‍රශ්නෙදී මීට වඩා මැදිහත් වීමක් අපේ රටෙන් විය යුතු නැද්ද? දැන් සති ගණනක් උනා. අපේ වගකිව යුත්තෝ නිදි. මේ මිනිස්සු ඕස්ට්‍රේලියාවත්, ඉන්දුනීසියාවත් අතර මිරිකෙන්න ඉඩ දීලා කරපු වැඩේ නීති විරෝධීතාවයි. ඒත් සේරම කොටි ගොඩට දාලා අපිට මේ විදිහට පැත්තකට වෙලා ඉන්න පුළුවන්ද? රජයකට විදේශ දූත සේවා නිලධාරීන් අමාත්‍යාංශ තියෙන්නේ මෙවැනි මොහොතක සක්‍රීයව ක්‍රියාත්මක වෙන්න නොවේද? තමන්ගේ පුරවැසියෙක් විදේශයකදී විපතකට පත් වූ විට ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම රජයක වගකීමක් මිස මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙන් සෑහීමකට පත් වීම යුතුකමක් නොවේ. මේ එක බෝට්ටුවක් නිසා බිඳී යන්නේ අපේ රටේ කීර්තිය හා අභිමානය බව අපේ රටේ බලධාරීන් තේරුම් නොගන්නේ මන්ද? බිඳී යන අභිමානය ගොඩ නැගීමට අපට කී කාලයක් ගතවේද? මේ ශ්‍රී ලාංකිකයන් ආපසු අපේ රටට භාර ගැනීමටත්, ඔවුන් නීති විරෝධී යමක් කර ඇත්නම් ඒ වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන බවටත් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමට අප රජයත් එහි නියෝජිතයනුත් පැකිලෙන්නේ මන්ද? අපට දුක හිතෙන්නේ අන්න ඒ නිසයි.

**මංගල -** ආණ්ඩුව මේ දවස්වල ගිලගෙන ඉන්න ලනුවේ තරමින් අපට හිතාගන්න පුළුවන් මංගලගේ "පොලිටික්ස්" වල ප්‍රමිතිය. විරුද්ධ පක්ෂ තුල මොනතරම් දේශපාලන ආචාර්ය මහාචාර්ය වරු හිටියත් ලංකාවේ දේශපාලනයේ ප්‍රායෝගිකත්වයට හුරුවෙන්න හුඟ දෙනෙකුට හැකියාවක් නැහැ. චින ඇදපු විපක්ෂයට කථා කරන්න මාතෘකාවක් දුන්නේ

27 වන පිටුවට

සංක්‍රමණිකයා

